ප්‍රවේශය

අර්මේනියාවේ වැනඩ්සෝර් ප්‍රදේශයේ සිදු වූ අමානුෂික ඝාතන දාමයෙන් සහ එමිලින්ගේ මරණයෙන් පසුව, "ගෝර්" ජීවත්ව සිටි නිවස මුළුමනින්ම ගිනිබත්ව විනාශ වී ගියේය.

ගෝහා නම් වූ එම භයංකාර ආත්මය නිවසේ පිටුපස ඇති ඕක් ගසක් මත තනා තිබුණු "අට්ටාලයක්" තම වාසස්ථානය කොට ජීවත් වීමට පටන් ගත්තාය.

ගෝහාගෙන් තම නිවුන් සොහොයුරාගේ ජීවිතයට අන්තුරක් වේ යැයි සිතූ ඇගේ මිත්තණිය ඇයගෙන් පොරොන්දුවක් ගත්තාය.

"කිසිම දිනෙක මෙම අට්ටාලය ඇති මායිමෙන් පිටතට නොපැමිණිය යුතුය."

කතාව පටන් ගන්නේ මෙතැන් සිටය.

මෙම කතාව අතිශයින්ම භයංකාර, ගුප්ත, කුතුහලයෙන් පිරී ගිය මෙම වෘත්තාන්තය අර්මේනියාවේ සිදු වූ සත්‍ය සිදුවීම් දාමයක් මූලාශ්‍ර කොටගෙන ලියවී ඇත.

මෙය ගෝහාර් පොතේ තවත් කොටසක් නොව "වෙනම" පොතකි.

ප්‍රථම මුද්‍රණය : 2020 නොවැම්බර්

මීෂා

2020 © මුතුමුදලිගේ නිශ්ශංක

මුද්‍රණය - නියෝ ග්‍රැෆික්ස් පුද්ගලික සමාගම,
44, උඩහමුල්ල දුම්රියපොළ පාර,
ගංගොඩවිල, නුගේගොඩ.
0112 820 220 | info@neo.lk

සෝදුපත් පරීක්ෂාව - චන්දික මදුෂාන් අබේවික්‍රම
කවර නිර්මාණය - කලණ ගංගානාත්

මෙම පොතෙහි සියලුම හිමිකම් ඇවිරිණි. කර්තෘගේ අවසරය නිසි පරිදි ලිපියකින් නොලබා මෙහි එන කිසිවක්ම, මොනම ආකාරයකින්වත් නැවත පළ කිරීම තහනම් වේ. එම තහනමට: අතින්, යාන්ත්‍රිකව හෝ විද්‍යුත් ක්‍රමයකින් පිටපත් කිරීම, වීඩියෝ හෝ ඕඩියෝ ලෙස නිර්මාණය කිරීම, ඊ -බුක් ලෙස හෝ වෙබ් අඩවිවල පළ කිරීමද ඇතුළත් බව සලකන්න.

සියලුම හිමිකම් ඇවිරිණි. මුතුමුදලිගේ නිශ්ශංක 2020

මට පොත් කියවන්න ආසාවක් තිබුණේ නැහැ.
මේක වෙද්දි මගේ වයස අවුරුදු 10ක් විතර ඇති.

අපේ පැත්තේ තිබුණා
"කුසුම් සෙවණ" කියලා පොඩි මොන්ටිසෝරි එකක්.
ඒ මොන්ටිසෝරි එක පාලනය කළේ
"ඇන්ජලා" කියලා ක්‍රිස්තියානි සිස්ටර් කෙනෙක්.

මේ මොන්ටිසෝරියේ එක පැත්තක තිබුණා
පොත් සීයක විතර පොඩි පුස්තකාලයක්.
කාලයක් වහලා තියලා හොඳටම දූවිලි බැඳිච්ච එකක්.
දවසක් සිස්ටර් ඇන්ජෙලා මට ලොකු වැඩක් බාර දුන්නා.
මේ පුස්තකාලය අස් කරන්න.

මම අකමැත්තෙන් හරි ඒක කරන්න බාර ගත්තා.
සති ගාණක් දූවිලි පිහදා පිහදා පොත් රාක්ක අස් කළා.
හැබැයි ඒ සති ගාණෙම මම තවත් වැඩක් කළා.
මම ඒ පොත් සේරම එකින් එක කියවන්න පටන් ගත්තා.
කියෙව්වා.
දිගටම කියෙව්වා, පුදුමාකාර ආසාවකින් කියෙව්වා.

මම හිතන්නේ,
මම පොත් කියවන්න පටන් ගත්තේ එතැනින්.

මට මතකයි සිස්ටර් ඇන්ජෙලා සැරින් සැරේ ඇවිත්
මම පොත් කියවන හැටි බලලා ආයෙමත් හැරිලා යනවා.
"ඉක්මනට අස් කරලා ඉවර කරන්න" කියලා කියන්නෑ.
නිකන්ම බලාගෙන ඉඳලා යන්න යනවා.

ඇය එහෙම බලා නොඉඳ
ඉක්මනට අස් කරන්න කිව්ව නම්
අද මම පොත් නොලියන්නත් ඉඩ තිබුණා.

මීෂා...
සිස්ටර් ඇන්ජෙලාට

අතිශයින්ම භයංකාර, ගුප්ත, කුතුහලයෙන් පිරී ගිය
වෘත්තාන්තයක් මම ඔබට ඉදිරිපත් කරමි.
එහෙත් මෙය කියවන ඔබ එක් දෙයක් නිවැරදිව අවබෝධ
කරගත යුතුය.
මෙය කියවූ පසුව ඔබට සිදු වන කිසිදු කම්පනයකට හෝ
කැලැඹීමකට මම වග කියන්නේ නැත.
මෙය දරුණු, මිලේච්ඡ ආත්මයක් පිළිබඳව වූ කතාන්තරයක්
බැවින්,
“මෙය කියවන විට ප්‍රවේසම් වන්න”
අත්හදා බැලීම් නොකරන්න.
එය එතරම්ම දරුණුය.
දෑස් වසා ගන්නා වූ සෑම මොහොතකම එය ඔබ ඉදිරියේ
පෙනී සිටිය හැක.

ආරම්භය

අපායෙන් ආපු එවුන්
ළඟ කොයින්ද "හොඳ හිතක්"?
උන්ගේ ඇස් සුදු දුමාරයෙන් පිරෙද්දී
මුළු ලෝකෙම මහ මූසල කළුවකින් වැහිලා යනවා.
මළවුන් නැඟිටිනවා.
ප්‍රේතයෝ බැල්ම දානවා.
දිෂ්ටී ඔලුව වටේ කැරකෙනවා.
හැමදේම දරුණු වෙනවා.
හැමදේම…

- (බ)රහාක් "ප්‍රේත" කවියක්

මෙම සිදුවීම සිදු වන විට මා වැනඩ්සෝර් අපරාධ විමර්ෂණ ඒකකයට අනියුක්තව සේවය කළෙමි. මා එහි ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු ලෙස වසර පහක් සේවය කොට තිබුණු අතර "මාර්කෝ"ගේ හදිසි අභාවයෙන් පසුව ඔහුගෙන් පුරප්පාඩු වූ "පොලිස් ස්ථානාධිපති" තනතුරට පත් වීමට මා හට හැකියාවක් ලැබිණ. කතාව පටන් ගන්නේ මෙතැන් සිටය.

මාර්කෝ වැනඩ්සෝර් පොලිසියට අනියුක්තව වසර විසි පහකටත් වඩා වැඩි කාලයක් සේවයක් කළ උසස් නිලධාරියෙකි. එම වසර විසි පහටම ඔහුට කිසිදු ලෙඩක්, අල්ප මාත්‍රයක හෝ දෝෂයක් නොතිබිණ. ඔහු පළල් වූ උරහිස්වලින්ද ජවසම්පන්න ශරීරයකින්ද යුක්ත වූ කෙනෙකි. එහෙත් එක් වරම (කුමක් හෝ සිදුවීමක් නිසා) ඔහු රෝගාතුර විය. ඔහුගේ රෝගය මුලින්ම ප්‍රවේණිගත ස්නායු ආබාධයක් යැයි වෛද්‍යවරුන් සැක පහළ කළත්, දින ගෙවී යත්ම ඔහු විකාරයෙන් කියවන්නටත්, ඔහුගේ අසල්වාසීන්ට නොහොබිනාකම් කරන්නටත්, දරුණු වන්නටත් පටන් ගත්තෙන් ඔහුව වැනඩ්සෝර් නගරයේම මානසික

රෝහලකට ඇතුල් කරන ලදි. එහෙත් එහිදී ඔහුගේ තත්වය තවත් දරුණු වූ අතර ඔහු එහි සිටි සේවකයෙකුත් මරාදමා සියදිවි නසා ගැනීමට තැත් කළෙන් ඔහුව එතැනින් යෙරෙවාන්වල ප්‍රධාන මානසික රෝහලකට මාරු කර යැවීය. ඔහුගේ අවසානය සිදු වූයේ එහිදීය. යෙරෙවාන් මානසික රෝහලේ සිටියදී ඇණයකින් උගුරු දණ්ඩ සිදුරු කරගෙන ඔහු මරුමුවට පත් වී ඇත. ඔහුගේ මරණයෙන් පසුව ඔහුගේ තනතුරත්, ඔහු සේවය කළ නිල කාමරය සහ ඔහු ජීවත්ව සිටි පොලිස් නිල නිවසත් මා හට හිමි විය.

ඔහුගේ තනතුරත්, රාජකාරි කාමරයත් හැරෙන්නට මා හට නිවසක් අවශ්‍ය වූයේ නැත. මා ඒ වන විටත් වැනඩ්සෝර්වල මගේම ගෙයක ජීවත් වූවෙන් එයින් සැනසීමට පත් වීමට මා හට හැකි වීය. එසේම ඔහු සහ මා අතර එතරම් දැනහැඳුනුම්කමක් නොතිබුණු අතර ඔහුගේ ජීවිතයේ අවසන් කාලය මානසික රෝගියෙකු ලෙස විඳවමින් මිය ගිය නිසාවෙන් ඔහු ජීවත්ව සිටි නිවසේම පදිංචි වීමේ අවශ්‍යතාවයක් මා හට නොවීය. එනමුත් පොලිස් නීති රෙගුලාසි අනුව පොලිස් ස්ථානාදිපතිට "නිල නිවසක්" හිමි විය යුතු වූයෙන් එය අතිරේක නිවසක් ලෙස තබා ගත් මම මගේ නිවසේම ජීවත් වීමට පටන් ගත්තෙමි.

මා නව තනතුරට පත්ව දින කිහිපයක් ගෙවී ගියේය. එක්තරා රාත්‍රියක අපූරු සිදුවීමක් සිදු විය.

රාත්‍රියෙහි වයින් වීදුරුවකුත් පානය කොට නින්දට ගිය මම මැදියම් රෑයේදී එක්වරම අවදි වුණෙමි. හරියටම මගේ ඇඳට අඩි කිහිපයක් එහායින් හිටගෙන සිටි කිසිවෙකුගේ හෝ ඡායාවක් මගේ නෙත ගැටිණ. එය දැකීමෙන් ශරීරය ලොමුදැහැ ගැන්වී යන තරම් වූ භීතියකින් පෙළී ගිය මම ඇඳෙන් බිමට පැන්නෙමි. අනතුරුව අන්ධකාරය තුළින් යාන්තමින් පෙනෙන එම ඡායාව දෙස බැලුවෙමි. එතැන සිටින්නේ කිසිවෙකු හෝ වේවා ඔහු තවමත් මා දෙස බලා සිටිනවාක් විය යුතුය. වේගයෙන් බිත්තියේ වූ ස්විචය දෙසට හැරුණු මම විදුලි ලාම්පුව දැල්වූයෙමි. කාමරය ආලෝකමත් විය. එහෙත් එතැන කිසිවෙකුත් නොවීය.

සමහර විට මා හීනයක් දකින්නට ඇත.එසේත් නැතහොත්.... මම කල්පනා කරන්නට පටන් ගත්තෙමි. නැත, එසේ විය නොහැක. මම දුටු ඡායාවේ වූයේ එතරම් උස් නොවූ, ඉතාමත් කුඩා ශරීරයකි. එහෙත් කුමක් හෝ හේතුවක් නිසා එක් වරම මගේ මනසට මීට දින කිහිපයකට පෙර මිය ගිය "මාර්කෝ"ව ආවේය. ඇඳේ හිඳගත් මම කල්පනා කරන්නට පටන් ගත්තෙමි.

මරණයට පත්වූවන් යළිත් අපව සොයාගෙන පැමිණෙන බැව් මම අසා ඇත්තෙමි. එහෙත් මම ඒවා විශ්වාස කරන්නෙක් නොවෙමි. නමුත් මෙවැනි සිදුවීමක් මගේ මවගේ මරණය සිදු වූ දිනත් සිදු වූවෙන් එය එක එල්ලේම ප්‍රතික්ෂේප කිරීමට හැකියාවක්ද මා හට නොවීය.

මගේ මවගේ මරණය සිදු වූ දින ඇගේ දේහය රෝහලට භාර කොට නිවසට පැමිණි මම සාලයේ ඉඳගෙන සිටියෙමි. මගේ බාල සහෝදරයෝ දෙදෙනාත් මා ඉදිරියේම ඉඳගෙන සිටියෝය. අපි සියල්ලෝම ශෝකයෙන් වෙළී සිටියෙමු. හරියටම මේ මොහොතේ, මගේ මිය ගිය මව අප තුන් දෙනා ඉදිරියේ පෙනී සිටියාය. ඇය මිය යන මොහොතේ ඇඳ සිටි සුදු සිල්ක් ගවොමින්ම සැරසී සිටි ඈ මොහොතක් වෙලා අප දෙස බලා සිට යන්නට ගියාය.

එය අපි තිදෙනාම දුටු බැවින්, ස්ථිරවම එය ඒ ආකාරෙන්ම සිදු වූ බැව් මම ඒකාන්තයෙන්ම දනිමි. ඇය අප ඉදිරියට පැමිණියේ අපට කුමක් හෝ පවසන්නට විය හැක. එසේත් නැතහොත් අපට ඇති ආදරය නිසා විය හැක.

මාර්කෝ...

මම යළිත් ඔහු ගැන සිතුවෙමි. ඒ සැබැවින්ම ඔහුද?
නැත, එසේ විය නොහැක. මාර්කෝ උස, ශක්තිමත් දේහයකින් යුක්ත වූ පොලිස් නිලධාරියෙකි. මා දුටු ඡායාවේ වූයේ අඩි හතරකටත් වඩා කුඩා ශරීරයකි. නැත, ඒ ඔහු විය නොහැක. මම කල්පනා කළෙමි. තවත් කල්පනා කළෙමි. එහෙත් එවන් කුඩා ශරීරයක් ඇත්තෙකු මා හඳුනන්නේ

නැත. මෙය මායාවකි. නැතහොත් නිකන්ම නිකන් මනෝරූපයකි. මම එය අමතක කර දැමීමට උත්සහ කළෙමි.

ඊට පහුවෙනි දින, මාර්කෝ රාජකාරි කළ පුටුවේම හිඳ සිටි මම එක්තරා විවේක මොහොතකදී පුටුවේ ඇන්දට හිස තබා ගනිමින් කල්පනා කරන්නට පටන් ගත්තෙමි. මගේ දෑස කාමරයේ සිවිලිමට යොමු වී දෙනෙත් වැසී යමින් තිබිණ. එක්වරම මගේ මේසය මත වූ පෑන බිම වැටෙන හඬ ඇසුණෙන් මම ඒ දෙස බැලුයෙමි. පෑන මේසය දිගේ රෝල් වී විත් මේසය අසල බිම වැටී ඇත. මා පහත් වී එය අතට ගැනීමට යෑමේදී මගේ දෑස මේසය යට වූ කිසියම් දෙයකට යොමු විය.

මෙය තනි සන ලීයෙන් කළ ශක්තිමත් රාජකාරි මේසයක් වූ අතර එහි යටින් වූ හිඩැසක් අස්සට වන්නට "ෆයිල් කවරයක්" රිංගවා ඇත. මම එම ෆයිල් කවරය එතැනින් එළියට ගෙන විවර කොට බැලීමි. එහි සුදු පැහැ කඩදාසියක් මත අඳින ලද චිත්‍ර කිහිපයක් විය. ඒ සියල්ලම කළු පැන්සල් තුඩකින් අඳින ලද ඒවා වූ අතර චිත්‍ර සියල්ලේම ඇත්තේ එකම රූපයක් බැව් මා හට නිසැකවම කියත හැක.

ඒ සියල්ලේම වූයේ "කුඩා දරුවෙකි". වයස අවුරුදු දහයකට අඩු, ගැහැනු දරුවෙක් ලෙස අනුමාන කළ හැකි ඇයගේ කොණ්ඩය උරහිස හරහා වැටී ඇත. ඒ සෑම චිත්‍රයකම ඇත්තේ පැන්සල් ඉරිවලින් අඳින ලද දිගු කොණ්ඩයත්, රවුම් මුහුණත්, ගවොමත් පමණි. ඇයගේ මුහුණෙහි ඇස් හෝ නාසා කිසිවක් සලකුණු කර නොතිබුණු අතර මුඛය තනි ඉරක් ලෙස ඇඳ තිබිණි. ඒ සියලුම චිත්‍රවල වූයේ මෙම රූපයම බැවින් එය මගේ කුතුහලයට හේතු වූ බැව් කිව යුතුය.

"නිසැකවම මෙය මාර්කෝ විසින්ම මෙතැන සඟවන ලද ෆයිල් කවරයක්" විය යුතුය. මේ චිත්‍ර ඔහුගේ දියණියක් විසින්

අඳින ලද චිත්‍ර විය හැක. එසේත් නැතහොත් ඔහු විසින් අඳින ලද ඔහුගේ දියණියගේ රූපය විය හැක.

ෆයිල් කවරය පැත්තකින් තැබූ මම යළිත් පුටු ඇන්දට හේත්තු වී සිවිලිම දෙස බලා කල්පනා කරන්නට පටන් ගතිමි. විවෘත වී තිබුණු මගේ දෑස් මත අර කොළයේ වූ චිත්‍රය මැවී පෙනෙන්නට විය. මගේ මනස එම චිත්‍රය ගැන සිතන්නට පටන් ගෙන තිබිණ. කුමක් හෝ හේතුවක් නිසා එම චිත්‍රය මගේ මනසින් ඉවත් කරලීමට මා හට හැකි වූයේ නැත.

එහි ඇත්තේ කටක් පමණි.

ඔහු කිසියම් හේතුවක් නිසාවෙන් ඇස් හෝ නාසා ඇඳ නැත. එසේ නැතහොත් හිතාමතාම එය නොකර සිටින්නට ඇත. මේසයේ වූ පෑනක් අතට ගත් මා එහි මා ඉදිරියේ වූ චිත්‍රයට ඇස් දෙකක් ඇන්දෙමි. එයට නාසයකුත් ඇන්දෙමි. එහි කට තනි ඉරකින් පමණක් සලකුණු කර තිබුණු නිසා එය මඳක් විචිත්‍ර කිරීමට සිතා කෙටි තොල් සහලක්ද නිර්මාණය කළෙමි. දැන් එහි කලින්ට වඩා ප්‍රියතාවයක් ඇත. යළිත් පෑන මේසය මත තැබූ මම ඒ දෙස බලා සිටියෙමි.

මා එසේ කළේ ඇයි දැයි මා නොදන්නා මුත්, මා එය නොකළ යුතු වූ දෙයක් ලෙස පසුව මට හැඟී ගියේය. චිත්‍රය යළිත් අනිත් කොළත් සමඟම ෆයිල් කවරය තුළට දැමූ මම එය මේස ලාච්චුවේ තබා අගුලු දැමුවෙමි.

රුධිරය

එදින මධ්‍යම රාත්‍රියෙත් මම නින්දෙන් අවදි වීමි. මම කලින් රාත්‍රියේ දුටු ජායාව දුටුවේ නැත. එහෙත් මම අර චිත්‍රයේ සිටි කුඩා ගැහැනු ළමයාගේ මුහුණ දුටුවෙමි.

එහි දෑස් හෝ නාසයක් නැත. ඇත්තේ තනි ඉරක් මෙන් ඇති මුඛය පමණි. එය එක්වරම විවෘතව ඈ බෙරිහන් දෙන්නට පටන් ගත්තෙන් මම කෑ ගසමින් අවදි වීමි. රාත්‍රිය පුරාවටම මට යළිත් නින්ද ගියේ නැත. කුමක් හෝ දෙයක් සිදුවෙමින් පවතියි. මාර්කොගේ කාමරයේ රාජකාරි කිරීමට පටන් ගත් දින සිට සිදු වෙන කුමක් හෝ දෙයකට මා සෙමෙන් ගොදුරු වෙමින් ඇත.

එදින රාත්‍රිය පුරාම නින්දකින් තොරව කල් ගෙවූ මම පහුවෙනි දින කාර්යාලයට ගිය මොහොතේ පටන්ම මාර්කෝගේ මරණය ගැන විස්තර සෙවීමට පටන් ගත්තෙමි. චිත්‍රයේ ඇස් සහ නාසය ඇන්දාක් සේම එයත් මා හිතාමතාම කළ දෙයක් නොවීය.

මාර්කෝ මානසික රෝගයකින් පෙළුණු බවත්, මානසික රෝහලේදී කිහිප වරක්ම සියදිවි නසා ගැනීමට උත්සහ කළ බවත්, එහිදීම සියදිවි නසාගත් බවත් හැමෝම දන්නා වූ කරුණු නිසාවෙන් එහි වැදගත්කමක් තිබුණේ නැත. එහෙත් මා හට හමු වූ චිත්‍ර පිළිබඳ වූ ගුප්ත සැකය මාව ඒ කරා යොමු කරන්නට ඇතැයි මම සිතමි. මුලින්ම මම ඔහුගේ පුද්ගලික ජීවිතය ගැන කිහිප දෙනෙකුගෙන්ම හාරා අවුස්සන්නට පටන් ගත්තෙමි.

ඔවුන් පැවසූ ආකාරයට මාර්කෝ විවාහ වී නැත. ඔහුට දරුවන්ද නැත. එසේ නම් මේසය යට සඟවා තිබී සොයාගත් චිත්‍රවල සිටින්නේ කවුරුන් විය හැකිද? ඒවා ඇන්දේ

මාර්කෝගේ දියණියක් නොවේ නම් ඒ සියල්ලම ඔහු විසින් අඳින ලද දේවල්ද?

මේ කාරණාවලින් මගේ සිත දැවී යද්දී මම මගේ කාර්යාල සහයකයෙකුත් සමඟ ඔහු අවසන් වරට නැවතී සිටි යෙරෙවානයේ "කොමිතාස්" මානසික රෝහල වෙත පිටත්ව ගියෙමි. එහි පිළිගැනීමේ නිලධාරිනියකට අපව හඳුන්වා දීමෙන් පසුව ඈ අපව මාර්කෝට ප්‍රතිකාර කළ වෛද්‍යවරියක් වෙතට ගෙන ගියාය. වයස අවුරුදු හැටක පමණ තැනැත්තියක වූ ඈ අපිට මාර්කෝගේ රෝගය මේ ආකාරයෙන් විස්තර කළාය.

"මහත්මයා, මාර්කෝගේ රෝගය මානසික රෝගයක්ම කියන්න බැහැ. මම අවුරුදු ගානණක්ම මේ රෝහලේ සේවය කරලා තියෙනවා... මානසික රෝගීන් අනන්තවත් දැකලා තියෙනවා. ඒත් මාර්කෝට තිබුණේ අසාමාන්‍ය රෝගයක්. මම මෙතෙක් දැකලා නොතිබුණ ගුප්ත ස්නායු අබාධයක්"

"ස්නායු අබාධයක්?" මම ඇසුවෙමි.

"මාර්කෝ අවුරුදු කිහිපයක්ම පොලිසියේ රාජකාරිය කරපු නිරෝගී කෙනෙක්. එහෙම කෙනෙක් කොහොමද එක පාරම මේ වගේ දරුණු රෝගයකට ගොදුරු වෙන්නේ? මම දන්න තරමින් මේ සියල්ලම සිද්ධ වෙන්නේ සති දෙකක් වැනි කෙටි කාලයක් ඇතුළත"

මා ඇසූ එම ප්‍රශ්නයට නිශ්චිතවම පිළිතුරක් දීමට ඇයට හැකි වූයේ නැත. දිගු සුසුමක් හෙළා බිම බලාගත් ටික වෙලාවක් කල්පනා කොට මෙසේ කීවාය.

"ඒ දේ මොකක්ද කියලා මම දන්නේ නැහැ. එහෙත් මාර්කෝගේ රෝගයත් එක්ක 'පොඩි දරුවෙක්ගේ' මොකක් හරි සම්බන්ධයක් තියෙනවා. සමහර විට ඒ මාර්කෝගේම දරුවෙක් වෙන්න පුළුවන්"

"දරුවෙක්?" මම පුදුමයෙන් ඇසුවෙමි.

"ඔව්... පොඩි ගැහැනු ළමයෙක්"

මට එක්වරම මාර්කෝ සහවා තැබූ චිත්‍ර කිහිපය මතක් විය.

"ඔබ කොහොමද හරියටම කියන්නේ?" මම ඇසුවෙමි.

එවිට නළල රැලි කරගෙන පරීක්ෂාකාරී බැල්මකින් මා දෙස බැලූ වෛද්‍යවරිය, "එන්නකෝ" කියා ඇය හිඳ සිටි ආසනයෙන් නැඟිටිටෙන් මමත් මගේ සගයාත් ඈ පසුපස යෑමට පටන් ගත්තෙමු.

ඇය රෝහලේ දිගු කොරිඩෝව දිගේ එහි කෙළවරේ වූ කාමරයක් වෙතට අප ගෙන ගියාය. එතැන සිටි සේවකයෙකුට "කාමරයේ දොර විවෘත කරන්නැ" යි පැවසූ ඈ එයට ඇතුළු විය.

එය ප්‍රමාණයෙන් මදක් විශාල, රෝගීන් රඳවන කාමරයකි. එහි වූයේ එකම එක ඇඳක් පමණි. වෙනත් කිසිම ආම්පන්නයක් එහි නොවීය. එහෙත් කාමරයට ඇතුල් වෙත්ම එහි බිත්තියක් වැසෙන්නටම ඇඳ තිබුණු චිත්‍රය දැකීමෙන් මම තුෂ්ණිම්භූත වී ගියෙමි.

කාමරයේ පැත්තක වූ බිත්තියක අඳුරු රතු පාටින් කුඩා ගැහැනු ළමයෙකුගේ සිතුවමක් නිර්මාණය කොට ඇත. ඇයගේ උරහිස දක්වා ඇදුණු කෙටි කොණ්ඩයක් නිසාවෙනුත්, මුහුණේ දැස් හෝ නාසය නොතිබුණු නිසාවෙනුත්, ඒ සිටින්නේ මාර්කෝ සැඟවූ ෆයිල් කවරයේ වූ ගැහැනු ළමයාගේ රූපයමැයි හඳුනාගත් මම බිත්තිය අසලටම ගොස් ඒ දෙස මනා බැල්මක් හෙළුවෙමි. ඒත් සමඟම මගේ මනස දිගු නිහැඬියාවක ගිලී යන බව මට දැනිණ. මා ඒ දෙස කොපමණ වෙලාවක් බලාගෙන සිටියා දැයි මා දන්නේ නැත. එහෙත් එක්වරම පිටුපසින් ඇසුණු ශබ්දයකින් ගැස්සී ගියෙන් මා යළිත් පියවී සිහියට එන්නට ඇත.

"අල්ලන්න එපා"

මම අත පහතට දැමුයෙමි. එය ඉහළට එසවුණේ කුමන මොහොතේ දැයි මා දන්නේ නැත. එහෙත් වෛද්‍යවරිය කෑ ගසන විට මගේ අත බිත්තිය දෙසට එසවී තිබිණ.

"ඔය ලේ. මාර්කෝ ඔය චිත්‍රය ඇඳලා තියෙන්නේ එයාගෙම රුධිරයෙන්. එයා බෙල්ල ඇණයකින් විදලා ඒ රුධිරයෙන් තමයි ඔය චිත්‍රය ඇඳලා තියෙන්නේ"

වෛද්‍යවරිය එසේ කියද්දී මම පුදුමයට පත් වුණෙමි. ගෙලෙන් එන රුධිරයෙන් මෙවන් චිත්‍රයක් ඇඳීමට තරම් මාර්කෝට තිබුණු උමතුව කුමක්ද? මාම කල්පනා කළෙමි.

"එතකොට කාටවත් බැරි වුණාද ඒ මනුස්සයව නවත්තන්න?" මගේ සගයා වෛද්‍යවරියගෙන් ඇසීය.

"කවුරුත් දැකලා නැහැ... මේ හැම කාමරයකම සීසීටීවී තියෙනවා... ඒත් ඒ වෙලාවේ මේ කාමරයේ විතරක් සීසීටීවී එක එකතැනම නතර වෙලා"

"ඒ කොහොමද?"

වෛද්‍යවරිය එයට පිළිතුරක් දුන්නේ නැත. ඇයට ඒ සඳහා පිළිතුරක් නොතිබෙන්නට ඇත.

චිත්‍රය

එදින රෝහලෙන් පැමිණි පසුව යළිත් මගේ මනස දැඩි වේදනාවකින් රිදුම් දෙන්නට වූයෙන්, රාජකාරියෙන් මිදී වේලපහම නිවෙසට ආ මම වයින් වීදුරු කිහිපයක්ම හිස් කොට නිදාගත්තෙමි. එහෙත් මගේ මනසට විවේකයක් තිබුණේ නැත. විටින් විට මනස හරහා ඇදී යන "ගැහැනු ළමයාගේ" චිත්‍රවලින් කිහිප වතාවක්ම අවදි වූ මම, ඇඳෙහි හිඳගෙන කල්පනා කරන්නටත්, යළි යළිත් මත්පැන් පානය කරන්නටත් පටන් ගත්තෙමි. අවසානයේදී සිත සන්සුන් කරගෙන නිදා ගැනීමට දෑස් වසා ගනිද්දීම මගේ කන් දෙක අසලම කිසිවෙකු හෝ මුමුනන හඬක් ඇසිණ.

“මට ඇස් දුන්නේ උඹ. මම දැන් උඹ දිහා බලාගෙන ඉන්නවා... මට උදව් කරපන් ලෙවෝන්”

ඒ හඬින් මම තිගැස්සී අවදි වූයෙමි. ඇඳෙන් බිමට පැන විදුලි බල්බය දැල්වූයෙමි. පෙර දිනයේදී සේම එතැන කිසිවෙකුත් නොවීය.

එයින් ඇතිවූ භීතියෙන්, මම උන්මත්තකයෙකු සේ නිදන කාමරයෙන් ඉවතට පැන දිව්වෙමි.

කාමරයෙන් එළියට දිව ගිය මම නිවසේ සාලය හරහා මිදුලට පැමිණියෙමි. මිදුලට එත්ම මගේ මනස දැඩි නිශ්ශබ්දතාවයක ගිලී යන්නට විය. පෙර කී භීතිය එහෙම් පිටින්ම මැඩී ගොස් මනස හිස් බවකින් වෙළී ගියේය. මා ඉදිරියේ මගේ නිල මෝටර් රථය විය. මා සැහැල්ලුවෙන් එයට ගොඩ වුණෙමි. එය පණගන්වා ගත්තෙමි. ඉන්පසු ධාවනය කරන්නට පටන් ගත්තෙමි. මේ සියල්ලම ඉබේම සිදු වූවාද, නැතහොත් මා හිතාමතාම සිදු කළා දැයි මා දන්නේ නැත. කරන්නා වූ කිසිම

දෙයක් ගැන මා හට අවබෝධයක් නොවීය. කලින් කීවාක් මෙන් මගේ මනස පූර්ණ හිස් බවකින් ගිලී ගොස් ඇත.

වැන්ඩ්සෝර් මාර්ගයේ වූයේ මූසල පාළුවකි. මා කොපමණ දුරක් කුමනාකාරයෙන් මෝටර් රථය පැදවූවාදැයි මම නොදනිමි. අඳුරු මාර්ගයන් දිගේත් තවත් අතුරු පාරවල් කිහිපයකත් ගමන් ගත් වාහනය එක්තරා නිවසක් ඉදිරියෙහි නතර විය.

මා දෑස් පුංචි කර මා ඉදිරියේ පෙනෙන නිවස දෙස බැලුයෙමි.

ඒ මාර්කෝ ජීවත්ව සිටි කොචාර් වීදියේ තිබුණු දෙමහල් නිවස විය.

එය දැකීමෙන් මා විස්මයට හෝ බියට පත් වූයේ නැත. ඒ වෙනුවට මගේ මනස තවමත් පෙර කී නිහැඬියාවේම ගිලී ගොස් තිබිණ. මොළයේ ස්නායු තන්තු මැරී ගියාක් මෙහි එහි කිසිම හැඟීමක් හෝ දැනීමක් නොවීය. මම ගේට්ටුව විවර කොට නිවසට ඇතුළු වීමි. නිවස දොරගුලු දමා ඇත. මාගේ අත ඉබේම සාක්කුවට ගියේය. නිවසෙහි යතුර එහි විය.
(මම ඔබට දිවුරා කියමි, යතුර මා සාක්කුවට දමා ගත් ආකාරය පිළිබඳව මට මතකයක් නැත.)

මම දොර විවර කළෙමි. මුළු නිවසම දැඩි අඳුරකින් වෙළී ගොස් තිබිණ. මා නිවසට තුළට පාදය තබත්ම නිවසේ ප්‍රධාන ලාම්පුව කිහිප වරක් නිවී ගොස් එක්වරම දැල්විණි. නිවසේ ඇති කිසිවක් දෙස මාගේ අවධානය යොමු වූයේ නැත. මා කලින් කීවාක් මෙන් මගේ මනස දැඩි නින්දක ගිලී ගොස් ඇත. මා දන්නේ මගේ පාදයන් ඉදිරියට අඩිය තබන ආකාරයත් මාගේ ශරීරය මාව මෙහෙයවන ආකාරයත් පමණි. ඒ හැරෙන්නට මා යන්නේ කොහේදැයි හෝ කරන්නේ කුමක්දැයි මා හට කල්පනාවක් නොවීය.

මම ඉදිරියටම ගමන් ගතිමි. නිවසේ ප්‍රධාන දොරෙන් ඇතුළුව කෙටි කොරිඩෝවකටත් එතැනින් තවත් විශාල කාමරයකටත් පැමිණි මම නිවසේ අවසන් කොටස යැයි සිතිය හැකි තැනකදී එතැන තිබුණු ලී පඩිපෙළක් නඟින්නට

පටන් ගතිමි. මෙම පඩිපෙළ නිවසේ උඩු මහලේ වූ සොල්දර කාමරයකට මාව ගෙන ගියේය.
එය තනි දැවයෙන් තැනූ කුඩා කාමරයක් විය. කාමරයට අඩිය තබත්ම එහි වූ රතු පැහැ විදුලි බල්බයක් දැල්වූයෙන් මුළු කාමරයම රක්ත වර්ණයෙන් නැහැවී යන්නට විය. මම එයින් සලිත වූයෙමි. රතු පැහැය මා වඩාත්ම බියට පත් කළ පැහැය වූවෙන් මගේ හදවත ගැහෙන්නට පටන් පටන් ගත්තේය. එහෙත් සමහම මම පියවි සිහියට පැමිණියෙමි. දැස් හොඳින් විවර කොට වට පිට බැලුයෙමි.

මා සිටියේ කොහේදැයි දකිද්දී මගේ මුළු ශරීරයම දැඩි සීතලකින් වෙවුලා ගියේය. එම සොල්දරයේ ලී බිත්ති පුරාම එකම රුවකින් යුත් චිත්‍ර බොහෝමයක් ඇඳ ඇත. සමහර තැන්වල එම චිත්‍ර ප්‍රමාණයෙන් විශාල වූ අතර තවත් සමහර තැන්වල එය කුඩා විය. ඒ සෑම චිත්‍රයකම ඒ ගැහැනු ළමයා සිටියාය. බිත්තියේ කිසිදු හිඩැසක් නැතිවම ගැහැනු ළමයාගේ රූපයෙන්ම මුළු සොල්දර කාමරයම පිරී ගොස් ඇත. ඒ මුහුනණේ දැසක් නොමැත. නාසයක් නොමැත. එහි වූයේ තනි ඉරකින් ඇඳි කටක් පමණි. එය දකිත්ම මනස පුපුරා යෑමට තරම් වූ භීතියකින් මම කෑ ගැසුවෙමි. යළිත් පිටුපසට හැරුණු මම දුවන්නට පටන් ගත්තෙමි. මා සිටියේ සැබැවින්ම රක්ත වර්ණ විදුලි බුබුළකින් එළිය කර තිබුණු සොල්දර කාමරයකය. මා කාමරයෙන් එළියට එත්ම එහි වූ බල්බය නිවී ගියෙන් මා ඉදිරියේ වූ සියල්ලම දැඩි අන්ධකාරයකින් වෙළී ගියේය.

මම වේදනාවෙන් පුපුරමින් තිබුණු මගේ හිසට දැතම තබා ගනිමින් භීතියෙන් කෑ ගසමින් ලී පඩිපෙළ තිබුණා යැයි සිතූ තැනට දිව ආවෙමි. යාන්තමින් පඩිපෙළේ පාදමට පාදය තැබූ මා එයින් බසින්නට පටන් ගත්තෙමි. එක්වරම මගේ පිටුපස වූ අන්ධකාර කාමරය තුළින් ශබ්දයක් නැහෙන්නට පටන් ගත්තේය. කිසිවෙකු හෝ එහි ලැලී තීරුවලට අතින් පහර දෙන්නාක් වැනි හඬක් වූ එය ක්‍රමයෙන් වැඩි වන්නට පටන් ගත්තේය. මා එය මායිම් කළේ නැත. මම දිව්වෙමි. ඒත් සමහම එතුළ සිටි කිසිවෙකු හෝ මා අසලට එන බැව් මා හට දැනිණ. මම නැවතුනේවත් පිටුපස බැලුවේවත් නැත. අන්ධකාරයේම භීතියෙන් වෙවුලමින් අඩියෙන් අඩිය

පඩිපෙළ බසින්නට පටන් ගත්තෙමි. එහෙත් මා පිටුපස සිටියේ කවරෙකු හෝ වේවා එම තැනැත්තා මගේ ශරීරය ස්පර්ශ කරන බැව් මා හට දැනුණෙන් මාගේ දෑස් එක්වරම පිටුපසට එල්ල විය.

මම ඇයව දුටුවෙමි. ඇයට තිබුණේ කාල වර්ණ කොණ්ඩයකි. අස්භාවික කාන්තියකින් දැල්වෙන ගිනි දැල් මෙන් එම කොණ්ඩය සෑම අතකටම විහිදෙමින්, දැල්වෙමින් තිබිණ. ඇයට දෑසක් නොමැත. මා ඇයව දකිත්ම ඈ ඇගේ කට විවෘත කර කෑ ගසන්නට පටන් ගත්තාය.

"මට උදව් කරපන් ලෙවෝන්. ඒ කෙල්ල මැරිලා යයි, මට උදව් කරපන්"

මුලින්ම කෙඳිරියක් සේ ඇසුණු ඒ හඬ පසුව විලාපයක් තරමටම වර්ධනය වූයෙන් මම එයින් ත්‍රස්ත්‍රව ගියෙමි. මා හට කල හැක්කක් නොවීය. පඩිපෙළ බසින ගමන්ම මා එම විලාප හඬ නොඇසෙන්නට දැතින්ම මගේ කන් දෙක වසා ගත්තෙමි. ඒත් සමඟම මා පිටුපසට තල්ලු වී ගියේය. මට මතක ඇත්තේ එපමණකි. මා පඩිපෙළෙන් පහළට විසිවී වැටෙන්නට ඇත.

දර්ශනය

මා යළිත් අවදි වන විට මා සිටියේ ගිනි ගෙන දැල්වෙන නිවසක් ඉදිරිපිටය. අවුල් වියවුල්ව ගිය සිතකින් යුක්තව මා ඒ දෙස බලා සිටියෙමී. එය ශීත කාලයේ දිනයක් වූ බැවින් මුලු පෙදෙසම හිමෙන් වැසී ගොස් තිබිණ. එහෙත් ගිනි ගනිමින් තිබුණු නිවස ඉදිරියට වැටෙමින් පැවති හිම, අස්වභාවික කාල වර්ණයකින් යුක්ත වූයෙන් මගේ දෑස අහස දෙසට යොමු විය.

"අහෝ දෙවියනි, එය මා දුටු මුස්පේන්තුම දර්ශනය නොවේ යැයි මා කෙසේ කියන්නද?"

නිවසට ඉහළින් වූ මුළු අහස් තලයම කාල වර්ණ දුම් වලාකුළුවලින් පිරී ගොස් ඇත. දැවී අළු වී යන නිවසේහි දුමාරය අහස සිපගනිද්දී, ඒවා හිම පතනයත් සමඟ එක්ව යළිත් පොළොවට පතිත වෙමින් පවතී. දුම් රොඩුත් සමඟ එක් වූ හිම වැස්ස අඳුරකින් යුක්ත වූයෙන් එය අතිශයින්ම භයානක විරූපාකාර දර්ශනයක් මැවීය. ඒ මොහොතේ දුම් රොඩු සහිත හිම පිඬැලි මගේ කබාය මතටත් වැටුණෙන් ඒවා අතින් පිසදාමින් මා නිවසින් හැකි තරම් ඈතට දිව යෑමට උත්සහ කළෙමි. එහෙත් එක්වරම වීදියෙන් ඇසුණු සයිරන් හඬකින් මාගේ දෙනෙත් ඒ දෙසට යොමු විය.

හිමෙන් වැසී ගිය වීදිය දිගේ වේගයෙන් පැමිණි පොලිස් මෝටර් රථයක් ගිනි ගනිමින් තිබුණු නිවස ඉදිරියේ නතර විය. එහි සිටි පොලිස් නිලධාරියා කාරයේ දොර විවර කොට ඔහුගේ පාදයක් ඉවතට තැබීය.

" මාර්කෝ" මම කෑ ගැසුවෙමි.

ඒ මාර්කෝය. මා ඔහුව හඳුනාගතිමි. එහෙත් ඔහුට මගේ හඬ ඇසුණේවත්, ඔහු මා දෙස බැලුවේවත් නැත.

ඔහු පාදය ඉවතට තබා කාරයෙන් එළියට එන්නට සැරසෙත්ම අහසේ පියඹා යමින් සිටි කපුටෙකු කාරයේ බොනට්ටුව මතට ඇද වැටුණෙන් ඔහුව යළිත් කාරයේම හින්දවිණ. ඔහු කාරයේ ඉදිරිපස වීදුරුව තුළින් බොනට්ටුව මතට වැටුණු අසරණ සතා දෙස බලා සිටියේය. ඔහුට එහා පසින් වූ ආසනයේ හිඳගෙන සිටි ටාකෝ බොනට්ටුව මතට වැටුණු සත්වයා දෙස බලමින් ගොරවන්නට පටන් ගත්තේය.

"මේක නම් හොඳ දවසක් වෙන්න බැහැ ටාකෝ" මාර්කෝ ඒ දෙස බලාගෙන කීවේය.

"පව් අසරණයා, එක්කෝ ඌ අර ගිනිගන්න ගේ අස්සේ හිර වෙලා ඉන්න ඇති, නැත්නම් පියාඹමින් ඉද්දී ගින්නට හසුවෙන්න ඇති"

කී ඔහු කමිස සාක්කුවෙන් සිගට්ටුවක් එළියට ගෙන එය දල්වාගෙන මද වෙලාවක් නිසොල්මන්ව බොනට්ටුව දෙස බලා සිටියේය. ඒ මතට වැටුණු පක්ෂියා වේදනාවෙන් දහලමින්, අත්තටු ගසමින් එතැනින් පියඹා යෑමට තැත් කළත් යළි යළිත් ඌ බොනට්ටුව මතටම ඇද වැටුණෙන් අවසානයේදී වේදනාවෙන් කෑගසමින්ම ඌ එතැනම මැරී ගියේය.

දහලමින් සිටි ඌගේ සිරුර නොසොල්මන් වනු දුටු මාර්කෝ සිගරට්ටුව විසි කොට කාරයෙන් නැඟිටගත්තේය. ටාකෝද ජනේලයෙන් එළියට පැනගත්තේය.

කාරයේ බොනට්ටුව අසලට පැමිණි මාර්කෝ ඒ මත මැරී සිටි පක්ෂියාගේ කකුලකින් ඔසවා එහාට මෙහාට හරවා බැලුවේය. ඌ මරණයට පත්ව ඇතත් ඌගේ දෑස තවමත් විවෘතව ඇත. ඌගේ පියාපත්වලින් අඩක්ම ගින්නට හසුවීමෙන් දැවී ගොස් ඇත. ඒවා මතට වැටුණු හිම පියලි

නිසාවෙන් එම පිලිස්සුම් තුළින් දුම් නඟින්නට පටන් ගත්තෙන් එයින් ඇතිවූ පිළිකුලත් සමඟම මාර්කෝ ඌව අසල වූ හිම පියස්සකට විසි කර දැමීය.
ඒත් සමඟම ඔහුගේ දෑස ඔහු ඉදිරියේ වූ ගිනි ගනිමින් පැවති නිවස දෙසට යොමු විය. කඩා වැටෙන කාල වර්ණ හිම පතනයත් සමඟම එහි ගින්නද ක්‍රමයෙන් අඩු වෙමින් පවතී. නිවස මුළුමනින්ම පාහේ දැවී අළු වී තිබුණෙන් තවත් සුළු මොහොතකින් ගින්නද සම්පූර්ණයෙන්ම නවතිනු ඇත. මාර්කෝ ඒ දෙස බලා සිටියදී ඔහුගේ කර පටියේ අටවා තිබුණු "පොලිස් රේඩියෝවෙන්" කාන්තාවකගේ හඬක් මතු වූයෙන් ඒ කවුරුන්දැයි හඳුනාගත් ඔහු රේඩියෝව කටට ළං කර ගත්තේය.

"ජුලී..."

"මාර්කෝ"

"ජුලී... කියන්න, කොහේද ඔයා දැන්?"

"මාර්කෝ, කිරෝවකාන් පාර අවහිර වෙලා... ගිනි නිවන රථවලට ඔය පැත්තට එන්න විදියක් නැහැ"

"ගිනි නිවන රථවල අවශ්‍යතාවයක් නැහැ ජුලී, දැනටමත් නිවස සම්පූර්ණයෙන්ම ගිනිබත් වෙලා ඉවරයි... ඒක ඇතුළේ ඉන්න කිසිම කෙනෙක් ජීවත් වෙන්න විදියක් නැහැ" කී මාර්කෝ රේඩියෝව කටින් මදක් ඈත් කොට එයින් ප්‍රතිචාරයක් ලැබෙන තුරු බලා සිටියේය.

පිළිතුරක් වෙනුවට “ග්ර්ර්ර්” ශබ්දය මතු වී ආයෙන් ඔහු එය කරේ අටවාගෙන ඔහු අසල සිටි සුනඛයා දෙස බැලීය. ඌට කුමක් හෝ දෙයක ඉවක් වැටී ඇත. ඌගේ දෑස එක එල්ලෙම ගිනි ගනිමින් ඇති නිවස දෙසටම එල්ල වී තිබිණ. ඒ දෙස බලාගෙනම ඌ වියරුවෙන් මෙන් ගොරවමින් සිටියි.

ටික මොහොතකින් යළිත් රේඩියෝව නාද වූයෙන් මාර්කෝ එහි බොත්තම ඔබා එයට පිළිතුරු දෙන්නට පටන් ගත්තේය.

"ජූලී... ඔයා කොහේද?"

"මාර්කෝ, මම නිවසේ පිටුපස තියෙන ප්‍රධාන වීදියෙන් ඔය පැත්තට එද්දී" කී ඇය මදක් නැවතුනාය.

ඇමතුම යළිත් එය විසන්ධි විය. මාර්කෝ එයින් කෝපයට පත් විය. රේඩියෝව පැත්තකට කර දැමූ ඔහු ටාකෝගේ දෑස් යොමු වී තිබුණු ඉසව්ව දෙස බැල්මක් හෙළීය. ඌ එක එල්ලේම, ඇතින් ඇති ගිනි ගන්නා නිවස දෙස බලාගෙන සිටියි. ඒ හැරෙන්නට එතැන වෙනත් කිසිවක් නොමැත. එහෙත් ටාකෝට ආ ඉව කුමක් වුවත් එය වැරදීමක් විය නොහැකි බැව් දන්නා මාර්කෝ ඌගේ පිටට තට්ටුවක් දමා ඌව ගොදුර වෙත මුදා හළෙන් පොලිස් සුනඛයා ඒ මොහොතේම නිවස දෙසට දුව යන්නට පටන් ගත්තේය. මාර්කෝ ඌ පසුපස ලුහුබැන්දේය.

ඒත් සමඟම යළිත් ඔහුගේ රේඩියෝව වැඩ කරන්නට වූයෙන් මාර්කෝ වේගය අඩාළ කොට එය අතට ගත්තේය.

"ජූලි?"

"මාර්කෝ... මම රෝහලට යන ගමන්"

"රෝහලට...? " මාර්කෝ එක්වරම නැවතිණ.

ගිනි ගනිමින් ඇති නිවස පිළිබඳව ඇමතුම මාර්කෝට ආවේ උදෑසන හතට ඔහු රාජකාරියට ඒමට සූදානම් වෙද්දීය. ඒ නිසාවෙන් ඔහු නිවසේ සිට කෙළින්ම මෙම ස්ථානයට පැමිණි අතර, ජූලීද ඇයගේ නිවසේ සිට එතැනට පැමිණෙමින් සිටියාය. එහෙත් ජූලී ආ යුත්තේ මෙම වීදියට පිටුපසින් ඇති කොරවකාන් දෙවැනි පටුමඟ හරහාය. ඊයේ රාත්‍රියේ සිට ඇද හැලුනු හිම පතනය හේතුවෙන් වීදි හිමෙන් පිරීගොස් තිබුණෙන් ඇයට අනතුරක් වෙන්නට ඇතැයි සිතූ මාර්කෝ ඇයගෙන් පිළිතුරක් ලැබෙන තුරු යුහුසුලුව බලා සිටියේය.

"ජුලී ජුලී... ඇයි රෝහලට යන්නේ...? " ඔහු ඇසුවේය.

"මාර්කෝ" යලිත් ජුලීගේ හඬ ආයේය. "මම නිවසේ පිටුපසින් ඇති ප්‍රධාන වීදියෙන් ඔය පැත්තට එන ගමන්. එහෙත් මට වීදියේදී ගැහැනු ළමයින් දෙන්නෙක්ව මුණ ගැහුනා. ඒ දෙන්නටම වෙඩි වැදිලා. එක්කෙනෙක් මිය ගිහින්. අනෙත් කෙනාට අසාධ්‍යයි"
ඇයට කීමට ලැබුණෙ එපමණකි. ඇයගේ හඬ සම්පූර්ණයෙන්ම රේඩියෝවෙන් වියැකී ගියේය. මාර්කෝ යළිත් ඇය ඇමතීමට උත්සහ කළත් එයත් ව්‍යර්ථ වූ තැන ඔහු එය අතහැර දමා ටාකෝ දිව ගිය ස්ථානය වෙත දුව යන්නට විය. ගිනි ගනිමින් ඇති නිවස හරහා ඌ නිවසේ පිටුපස ඇති වන ලැහැබ වෙත දිව ගොස් එතැන වූ විශාල වෘක්ෂයක් ළඟ නැවතුනේය. ඌගේ දෑස එක එල්ලේම එම වෘක්ෂය දෙසට එසවී ඇත. ඒ දෙස බලමින් ඌ උඩ පනින්නටත්, ගොරවමින් බුරන්නටත් පටන් ගත්තේය. මාර්කෝ එතැනට දිව ආවේය. ඔහුගේ දෑස ටාකෝ බුරමින් සිටි වෘක්ෂය දෙසට එල්ල විය. එය දෙස බලත්ම දුටු දර්ශනයෙන් ඔහු වෙවුලා ගියේය.

එය අතිශයින්ම ජුගුප්සාජනක දර්ශනයකි.

ඔහු ඉදිරියේ සද්දන්තයෙකු සේ නැඟී සිටි මෙම වෘක්ෂයෙහි අතු හිම පියලිවලින් පිරී ගොස් ඇත. ඒවා සූර්යාලෝකය වැටීමෙන් රාත්‍රියෙහි එල්ලන ලද ලන්තෑරුම් මෙන් දිලිසෙන්නට විය. එහි ගස් දෙබොක්කාවේ ලැලිවලින් සෑදූ අට්ටාලයක් ඇත. මාර්කෝ දුටු ජුගුප්සාජනකම දර්ශනය වූයේ මෙම අට්ටාලය වටා වූ සෑම දෙසටම විහිදී ගිය අතු අතරය.

එම අතු මත මළකඳන් එල්ලෙමින් තිබිණ. එය දැකීමෙන් මාර්කෝගේ මුහුණ තුෂ්ණිම්භූත විය. ඔහු විශාල කරගත්, වික්ෂිප්ත වූ දෑසින් යුක්තව ඒ දෙස බලා සිටියේය. උදෑසන මෙම ස්ථානයට පැමිණෙද්දී ඔහුගේ කාරයේ බොනට්ටුව මතට වැටී මිය ගිය කපුටාගේ මළ සිරුරත්, ඔහුට ඇතින් ගිනි ගනිමින් දැවෙන නිවසත්, ආකාශයේ සිට ඇද වැටෙන කාල

වර්ණ මූසල හිම වැස්සත් කරණ කොටගෙන දැඩි පශ්චාත්තාපයකින් වෙළී සිටි මාර්කෝ ගස වටා වූ මෙම මළකඳන් දැකීමෙන් තවත් තැතිගත්තේය. ඔහු රේඩියෝවට කට තබා කතා කරන්නට උත්සහ කළේය. එහෙත් ඔහුගේ මුවින් කටහඬක් පිට නුවූයෙන් දණහිසට දෑත තබා ගත් ඔහු හිස පහත් කොටගෙන සංසුන් වීමට උත්සහ කළේය.

වෘක්ෂය වටා මළමිනී හයකට ආසන්න ප්‍රමාණයක් එල්ලෙමින් ඇත. ඒවා අඩි විස්සකට වඩා උඩින්, ගස් දෙබල ඇති අට්ටාලයට සමානුපාතිකව එක රවුමට එල්ලා ඇත. ඔහු ඒ දෙස විමසිලිමත්ව බැලීය. එම මළමිනී සමහරක හිස කඳින් වෙන් වී ඇති අතර, ඒවා කඳ හරහා කවාකාරව බැඳ ඇති ලණුවලින් තදකර ගසේ අතුවල එල්වා ඇත. හිස ඇති මළකඳන් කිහිපය බෙල්ල වටා දැමූ කඹවලින් බැඳ එල්ලා තිබිණ. මෙය නිසැකවම ම්ලේච්ඡ ඝාතනයක් යැයි ඔහු සිතුවේය.

ඔහුගේ මනස දැඩි භීතියකින් වෙළී ගිය මේ මොහොතේ රේඩියෝව තුළින් කන් බිහිරි වන තරම් වූ අමිහිරි හඬක් නැඟී ආයෙන් ඔහු එය කර පටියෙන් මුදා අතට ගෙන විසන්ධි කිරීමට තැත් කළේය. එහෙත් එය විසන්ධි වූයේ නැත. ටික වෙලාවකින්ම එම අමිහිරි හඬ අඩු වී ගොස් එයින් කුඩා ගැහැනු දරුවෙකුගේ මිහිරි හඬක් නැඟී ආයේය. එම හඬ ඉතාමත්ම සියුම්ව රේඩියෝවෙන් ඇසෙන විට මාර්කෝ එම හඬට වශීකෘත වූවාක් මෙන් එය අසා සිටියේය. එය ඒ තරම්ම කන්කලු වූ මිහිරි හඬකි. ස්වප්නයක සිටියදී කන ළඟට කොදුරා ගයන අපූරු ගීතයක් මෙන් එය මාර්කෝව සන්සුන් කළේය. වෘක්ෂය මත වූ මළමිනී දැකීමෙන් සුදුමැලි වී ගිය ඔහුගේ මුහුණ යළිත් ප්‍රාණවත් වන්නට වූවේය. එම මිහිරි ගීතය මෙසේ මුමුනන්නට පටන් ගත්තේය.

“මාර්කෝ..
මට ඇස් දෙක දීපන්.
උඹේ ඇස්වලින් දකින්නට මට
උඹේ ඔය ඇස් දෙක දීපන්"

ජුලී

"යක්ෂයාද වරක් දේව දූතයෙකි"

තවත් මොහොතකින් නිවසට ඇතුළුවන මාර්ගය "ඇතුලුවීමට තහනම්" කලාපයක් ලෙස වසා දැමිණ. වැනඩියෝර් සහා ස්පීතාක් පොලිස් ස්ථානවලින් නිලධාරීන් කිහිප දෙනෙක්ම මේ ස්ථානයට පැමිණි අතර "මිනිසුන් සය දෙනෙකුව මරා ගසක් වටේ එල්ලා ඇති" ආරංචිය ප්‍රවෘත්තිවල ප්‍රධාන සිරස්තලය බවට පත් වීමෙන්, විවිධ මාධ්‍යයන් මෙම ස්ථානයට රොක් වන්නට වූයෙන් ඉතිරි පරීක්ෂණ කටයුතු "ස්පීතාක්" ප්‍රධාන පොලිසියට පැවරූ මාර්කෝ එතැනින් මිදී යළිත් ඔහුගේ නිල රථය වෙතට ආවේය. නිවස මුළුමනින්ම ගිනිබත්ව අවසන් වී ඇත. ආකාශය කලින් පැවති කාල වර්ණයෙන් මිදී උදෑසන සූර්‍යාලෝකයෙන් බබළමින් පවතියි. මාර්කෝ විසිල් පාරක් ගසා මාධ්‍යවේදීන් සහ පොලිස් නිලධාරීන් වට වී සිටි වෘක්ෂය දෙස බලා උන් ටාකෝට අඬගැසුවෙන් ඌ දුවගෙන විත් විවර කර තිබුණු ජනේලය තුළින් වහානය ඇතුළට පැනගත්තේය. මාර්කෝ ඔහුගේ රේඩියෝවට කට තබා යළිත් ජුලීට ඇමතුමක් ගත්තේය. එහෙත් එයින් ආවේ වෙනත් පොලිස් නිලධාරියෙකුගේ කටහඬකි.

"මාර්කෝ.... ජුලීගේ කාර් එක කිරෝවකාන් මාර්ගයේදි අනතුරකට ලක් වෙලා. ඇය හිහින්ස් රෝහලේ"

ඔහු එසේ පවසත්ම මාර්කෝ ඔහුගේ රථය පණගන්වා එය හරවා ගත්තේය. ඔහුගේ සිත දැඩි ලෙස කැලඹී ඇත. සුක්කානම තරයේ අල්වා ගනිමින් හැකි තරම් වේගයෙන් රිය පැදවූ ඔහු නිවස පිහිටි අතුරු වීදියෙන් මිදී රථය කිරෝවකාන්

ප්‍රධාන මාවතට හරවා ගත්තේය. ඉන්පසුව පොලිස් රථයේ “සයිරන් හඬ” ක්‍රියාත්මක කළ ඔහු හැකි තරම් වේගයෙන් "හිඟින්ස් රෝහල" කරා එය පැදවූවේය.

"මම උඹට කිව්වා ටාකෝ, මේක මුස්පේන්තු දවසක් විත්තිය" යමින් ගමන් ඔහු ටාකෝට මුමුනන්නට විය.

හිඟින්ස් රෝහල වැනඩ්සෝර්වල තිබුණු ප්‍රධානතම රෝහලක් වූයෙන් එය මේ මොහොතේ රෝගීන්ගෙන් පිරී ගොස් තිබිණ. ශීත සෘතුව ආරම්භය "වැනඩ්සෝර් වැසියන්ගේ" ජීවිතවලට ඒ තරම් හොඳ කාලයක් නොවීය. එයින් රෝගාතුර වූවන්ගේ එකම පිහිට වූයේ දිගු කඳු මායිමකට මැදිව පිහිටා ඇති මෙම මනස්කාන්ත රෝහල පමණි. මාර්කෝ රෝහල ඉදිරියේ රථය නවත්වා ටාකෝ දෙස බැලුවේය.

"ටාකෝ... උඹ කාර් එකේම ඉඳපන්" කී ඔහු උගේ කර පටිය කාරයේ වූ දම්වැලකට අමුණා කාරයෙන් බැස ගත්තේය. ඔහුගේ දෑස ඔහු ඉදිරියේ වූ රෝහල් පරිශ්‍රය වෙතට යොමු විය. එතැන තවත් පොලිස් නිල රථයක් නවත්වා ඇත. මාර්කෝ ඒ දෙසට යන්නට පටන් ගත්තේය.

"කැප්ටන්" ඔහු එතැනට පැමිණෙත්ම කාරයෙන් බැසගත් නිලධාරීන් දෙදෙනෙකු ඔහුට සැලියුටයක් ගසා ආචාර කළෝය. ඔවුන් වැනඩ්සෝර් පොලිසියටම අනියුක්තව සේවය කළ පොලිස් නිලධාරීන් දෙදෙනෙකි.

"ලුතිනන්, මොකක්ද ජුලීට වුණේ?" මාර්කෝ එතැන සිටි එක් නිලධාරියෙකුගෙන් ඇසූයෙන් කොට, මදක් තරබාරු වූ නිලධාරියා මාර්කෝ සමඟ රෝහල වෙතට ඇවිදින්නට පටන් ගත්තේය.

"ජුලීව කිරෝවකාන් දෙවැනි පාරෙදි අනතුරකට ලක් වෙලා මාර්කෝ...ඇය මේ වෙද්දි ඉන්නේ දැඩි සත්කාර ඒකකයේ"

මාර්කෝ එයින් සුදුමැලි වී ගියේය. කිරොවකාන්වල නිවසක් ගිනි ගන්නා බවට ආරංචිය ලැබුණු විට ජුලීට හැකි ඉක්මනින්ම එතැනට පැමිණෙන්නැයි කීවේ ඔහුය. ඇයට එසේ නොකියා සිටියා නම් හොඳ යැයි ඔහුට හිතෙන්නට ඇත. ඊටත් වඩා ජුලී සහා මාර්කෝ අතර එතැනින් එහාට ගිය සම්බන්ධයක්ද තිබිණ. අවුරුදු විස්සකටත් වඩා පොලිස් රැකියාවේ යේදී සිටි ඔවුන් දෙදෙනා "නීත්‍යානුකූල නොවන" අඹු සැමියන් ලෙසද ජීවත් වී තිබුණෙන් "ජුලී" මාර්කෝගේ ජීවිතයේම පංගුකාරියක් වූවාය. ඔහු ඇට ආදරය කළේය. ඇය ගැන නිරන්තරයෙන්ම සොයා බැලීය. මේ යන ගමනේදී ඇයට සිදු වූ විපත ගැන අසා ඔහු වඩාත්ම කම්පා වූයේ ඒ නිසාය.

මාර්කෝ අනිත් නිලධාරියාත් සමඟ රෝහල් කොරිඩෝව හරහා වේගයෙන් ගමන් කළේය. ඔවුන් රෝහලේ පිළිගැනීමේ කවුන්ටරය අසලට එත්ම ඒ අසල සිටි වෛද්‍යවරියක්, රෝහල තුළට එමින් සිටි පොලිස් නිලධාරීන් දෙදෙනාව දුටුයෙන් එතැනම නැවතුණාය.

"මාර්කෝ" ඇය අතින් සන් කොට ඔහුට අඬ ගැසුවාය.

මාර්කෝ වැනඩ්සෝර් පොලිසියට අනියුක්තව ඔහුගේ ජීවිතයෙන් අඩක්ම ගත කොට ඇති පුද්ගලයෙකි. ඒ නිසාම එහි සිටි මිනිසුන් සමඟද ඔහුට සමීප සම්බන්ධයක් තිබිණ.

"ජේස්... කොහොමද දැන් ජුලීට?"

වෛද්‍යවරියගේ මුහුණේ වූයේ අපේක්ෂා භංගත්වයකි. මාර්කෝ දෙස බැලූ ඈ, ජුලී සිටින්නේ බොහෝ අවදානම් තත්වයක බැව් පවසන්නාක් මෙන් හිස දෙපසට වනා බයාදු හඬකින් "එන්න" යැයි පවසා ඔවුන්ව රෝහලේ වූ තවත් කොරිඩෝවක් දිගේ රැගෙන යන්නට වූවාය.
මෙම කොරිඩෝව කෙළවරේ වූයේ හදිසි සැත්කම් ඒකකයයි

"මාර්කෝ... ජුලීගේ තත්වය ගොඩක් අවදානම්.. අනතුරින් ඇයගේ හිස් කබලට දරුණු විදියට හානි වෙලා. අද දවස

ඇතුළත ඇයට තවත් සැත්කමක් කරන්න වෙයි. මාර්කෝ එහින් බලවත් වේදනාවට පත් විය.

වසර කිහිපයක් පුරාම තමන් සමඟ පොලිස් රාජකාරියේ නියුක්ත වූ තම සහායිකාවට සිදු වූ අනතුර ඔහුට විශ්වාස කළ නොහැක්කකි. හැරත් ගත වූ අවුරුදු කිහිපය මුළුල්ලේම ඇය කිසිම දිනෙක මෙවන් අනතුරකට භාජනය වී නොමැත. ඇය පැදවූ මෝටර් රථය ඇයගේ අතට හොඳින් හුරු පුරුදු වූ එකක් වූයෙන් එක්වරම මෙවන් අනතුරක් සිදු වීම මාර්කෝව මවිතයට පත් කළේය.

"ජුලීට මේ වගේ අනතුරක් සිදුවීම මට නම් කොහෙත්ම විශ්වාස කරන්න බැහැ ලුතිනන්, කොහොමද මේක වෙලා තියෙන්නේ?" ඔහු අසල සිටි නිලධාරියා දෙස හැරුණු මාර්කෝ ප්‍රශ්න කළේය.

"හරියටම කියන්න බැහැ කැප්ටන්. අපි ජුලීගේ මෝටර් රථය ගොඩ ගත්තේ කිරෝවකාන් මාර්ගයේ පල්ලමකට වැටිලා තියෙද්දී. ඒ වෙද්දිත් ජුලී ඒක ඇතුළේ හිරවෙලා හිටියේ... අර ගැහැනු ළමයට නම් ඒ තරම් දරුණු හානියක් වෙලා නිබ්බේ නැහැ"

"ගැහැනු ළමයා...?" මාර්කෝ එය යළිත් මිමුනුවේය. ජුලීගේ රේඩියෝවෙන් පැමිණි අවසන් ඇමතුමෙනුත් කීවේද පොඩි ගැහැනු ළමයෙකු පිළිබඳ කතාවකි.

'නැත, ඇය කීවේ ගැහැනු ළමයින් දෙදෙනෙකු ගැනය'

මාර්කෝ නළලට අතක් තබාගෙන මද වෙලාවක් කල්පනා කළේය.

"එක්කෙනෙක්ද දෙන්නෙක්ද?"

ඔහු පොලිස් නිලධාරියාගෙන් ඇසුවේය.

"එක්කෙනෙක්.. අපි කාර් එක බැවුමෙන් ගොඩ ගනිද්දි ඒකේ හිටියේ එක කෙල්ලෙක් විතරයි"
ඔහු කීවේය.

"වෙන්න බැහැ" මාර්කෝ කුතුහලයෙන් යුක්තව මිමිනුවේය.

කොරිඩෝව දිගේ ඇවිද ගිය වෛද්‍යවරිය එහි වූ වාට්ටු කාමරයක් ඉදිරියේ නතර වූවාය.

"ඇතුළුවීම තහනම්" එහි උඩ රතු අකුරින් ගසා ඇත. වාට්ටුවේ දොරේ තිබුණු වීදුරු කවුළුවෙන් එහි ඇතුළත බැලූ මාර්කෝගේ දෑස් කඳුළින් පිරී යන්නට විය. ඔහු වඩාත්ම ආදරය කළ කාන්තාව මේ මොහොතේ අප්‍රාණිකව වාට්ටුව මැද වූ ඇඳක වැතිර සිටියි. ඇය වටා සවි කර ඇති යන්ත්‍ර තුළින් නික්ම ආ බට කිහිපයක්ම ඇයගේ ශරීරයට කිඳා බැස ඇත. ඇය අසල හෙදියක් ඇයට සාත්තු කරමින් සිටියි. මද වේලාවක් වේදනාවෙන් ඒ දෙස බලාගෙන සිටි මාර්කෝ ඔහුගේ දෑස එතැනින් ඉවතට ගත්තේය. තමන් සහ ජුලී අතර ඇති සම්බන්ධය අතිශයින්ම රහසිගත එකක් වූයෙන් තමන් සමඟ සිටි පොලිස් නිලධාරියා එය දැන සිටියේ නැත. කිසිවෙක් එය දැනගත යුතුද නැත. ඇයව දැකීමෙන් ඇති වූ ශෝකය නිසාම ඔහු තත්පර කිහිපයක් නිහඬව සිටියේය. අවසානයේදී ඔහු යළිත් පොලිස් නිලධාරියා දෙස හැරිණ.

"කෝ බේරගත්තු ගැහැනු ළමයා?"

පොලිස් නිලධාරියා ඒ ගැන වැඩි තොරතුරක් දැනගෙන සිටියේ නැත. ඔහු දැන සිටියේ අනතුරින් පසුව ඇයව රෝහල්ගත කොට ඇති බැව් පමණි. ඔහුගේ දෑස වෛද්‍යවරිය දෙසට හැරිණ.

.

"පොඩ්ඩක් ඉන්න" කී වෛද්‍යවරිය ඇයගේ ජංගම දුරකථනයෙන් කිසිවෙකුට හෝ ඇමතුමක් ගත්තාය.